සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2015 ජූලි

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

2015-07-25
පස්වරු
[1.00 – 3.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***කාලය:*** *පැය 02 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයීම අනිවාර්ය වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *ප්‍රස්තාර කොළ සපයනු ලැබේ.*

(7) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(8) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, ආර්ථික විද්‍යාවේ හිඟකම යන්නෙහි අර්ථය නිවැරදිව විස්තර කරන්නේ කුමක් ද?

(1) හිඟකම යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා සම්පත් ඌන ලෙස භාවිත කිරීමයි.

(2) හිඟකම යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා සම්පත් විකල්ප ලෙස භාවිත කිරීමයි.

(3) හිඟකම යනු මිනිස් අවශ්‍යතාවයන්ට සහ අසීමිත උවමනාවන්ට සාපේක්ෂව සම්පත්වල පවත්නා සීමිත භාවයයි.

(4) හිඟකම යනු කැපකරන භාණ්ඩයකින් ඇතිවන ආවස්ථික පිරිවැයයි. (ලකුණු 02)

**1.2** නිෂ්පාදන හැකියා වක්‍රයෙන් පෙන්නුම් කරන්නේ:

(1) භාණ්ඩ නිෂ්පාදනය සඳහා බලපාන තාක්ෂණික සොයා ගැනීමයි.

(2) සම්පත් පූර්ණ සේවානියුක්තව සහ පවත්නා තාක්ෂණය මගින් ආර්ථිකයකට නිපදවිය හැකි භාණ්ඩ වර්ග දෙකක නිමැවුමේ උපරිම සංයෝගයන් ය.

(3) රටක ආර්ථික වර්ධනයයි.

(4) වඩාත් කාර්යක්ෂම ලෙස සම්පත් වෙන්කිරීමයි. (ලකුණු 02)

**1.3** මිල යාන්ත්‍රණය මගින් මූලික ආර්ථික ගැටළු විසඳනු ලබන්නේ:

(1) සැලසුම්ගත ආර්ථිකයකදී ය. (2) වෙළෙඳපොල ආර්ථිකයකදී ය.


(3) මිශ්‍ර ආර්ථිකයකදී ය. (4) පරිවර්තන ආර්ථිකයකදී ය. (ලකුණු 02)

**1.4** භාණ්ඩයක මිල රු.10/- සිට රු.15/- දක්වා වැඩි වූ විට, එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය ඒකක 2,500 සිට ඒකක 2,000 දක්වා අඩුවේ. මෙම භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය:

(1) අනම්‍ය වේ. (2) නම්‍ය වේ.

(3) ඒකීය නම්‍ය වේ. (4) පූර්ණ නම්‍ය වේ. (ලකුණු 02)

**1.5** භාණ්ඩයක් සඳහා ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර පහත සඳහන් රූප සටහනෙන් පෙන්නුම් කරයි:




සමතුලිත මිල රු.10/- ක් වන අතර සමතුලිත ප්‍රමාණය ඒකක 15 ක් වේ.

පාරිභෝගික අතිරික්තය වන්නේ:

(1) රු.150/- කි. (2) රු.300/- කි.

(3) රු.75/- කි. (4) රු.100/- කි. (ලකුණු 02)

**1.6** "කළු මුදල්" යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක් ද?

(1) පුද්ගලයාගෙන් පුද්ගලයාට මාරු වී තිබීම නිසා කළු පැහැ ගැන්වී ඇති මුදල් ය.

(2) නීත්‍යානුකූල ක්‍රියාමාර්ග හරහා මිනිසුන් බොහොමයකගේ අතින් අතට ගිය මුදල් ය.

(3) උපයාගත් ආකාරය ප්‍රසිද්ධියට පත් කළ නොහැකි නීත්‍යානුකූල නොවන ක්‍රියාවලින් උපයා ඇති මුදල් ය.

(4) මුහුණත වටිනාකමට වඩා අඩු නෛසර්ගික වටිනාකමක් ඇති මුදල් ය. (ලකුණු 02)

**1.7** මහ බැංකුවේ අරමුණක් වන්නේ:

(1) රාජ්‍ය මූල්‍ය (ෆිස්කල්) ප්‍රතිපත්ති මෙහෙයවීම ය.

(2) වාණිජ බැංකුවලට අවසාන ණය දෙන්නා ලෙස ක්‍රියා කිරීම ය.

(3) ආර්ථිකය සහ මිල මට්ටම ස්ථායීකරණය කිරීම ය.

(4) ජාතික ණය කළමනාකරණය කිරීම ය. (ලකුණු 02)

**1.8** 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව, 2014 වර්ෂයෙහි ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතිකය වූයේ:

(1) 5.4% කි. (2) 7.4% කි.

(3) 6.4% කි. (4) 8.4% කි. (ලකුණු 02)

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, රජයේ වර්තන සංක්‍රාම සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) රජය විසින් ජපානයෙන් යන්ත්‍රයක් මිලදී ගැනීම.

(2) රජය විසින් පකිස්තානු ජාතිකයෙකුට පොලිය ගෙවීම.

(3) රජය විසින් ශ්‍රී ලාංකිකයෙකුට ඒක පාර්ශ්වික ගෙවීමක් කිරීම.

(4) ඉහත සඳහන් කිසිවක් නොවේ. (ලකුණු 02)

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, විදේශ විනිමය වෙළෙඳපොළේ කාර්යයක් තෝරන්න:

(1) අන්තර්ජාතික ගනුදෙනු සඳහා වාණිජ බැංකුවලට පහසුකම් සැපයීම.

(2) ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර දේශීය මුදල් විදේශීය මුදල් වලට හුවමාරු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

(3) රටෙහි ස්ථාවර විනිමය අනුපාතිකය තීරණය කිරීම.

(4) සංවර්ධනය වෙමින් පවතින රටවලට විදේශ ප්‍රාග්ධනය මාරු කිරීම සඳහා යටිතල පහසුකම් සැපයීම.
(ලකුණු 02)

*ප්‍රශ්න අංක 1.11 සිට 1.15 දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයන් **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න. තෝරාගත් උත්තරය (**සත්‍ය හෝ අසත්‍ය** යන්න) ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** යම් අවස්ථාවක් දක්වා ආන්තික උපයෝගිතාවය හීන නොවන අවස්ථා තිබේ. (ලකුණු 02)

**1.12** සාමාන්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යයේදී සාමාන්‍ය පිරිවැය ආන්තික පිරිවැයට සමාන වේ. (ලකුණු 02)

**1.13** රටක ඒක පුද්ගල ආදායම මගින් ජාතික ආදායම සාධාරණ ලෙස බෙදියාම පෙන්නුම් කරයි. (ලකුණු 02)

**1.14** රටක මහ බැංකුව විසින් නම්‍ය විනිමය අනුපාතිකය නියම කරනු ලබයි. (ලකුණු 02)

**1.15** ගොවියන් ආරක්ෂා කිරීම සඳහා එක්තරා කෘෂිකාර්මික නිෂ්පාදිතයකට රජය විසින් මිලදී ගැනීමේ අවම මිලක් පනවනු ලබයි. (ලකුණු 02)

*ප්‍රශ්න අංක **1.16** සිට **1.18** දක්වා හිස්තැන පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරා ගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමග, උත්තර පොතේ ලියන්න.*

**1.16** අදාල භාණ්ඩයේ මිල හැර ඉල්ලුම කෙරෙහි බලපාන වෙනත් සාධකයක් වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුම වෙනස් වුවහොත්, ඉල්ලුම් වක්‍රය ....................... (දකුණට හෝ වමට විතැන් වේ / එම ඉල්ලුම් වක්‍රය දිගේ ඉහළට හෝ පහළට ගමන් කරයි). (ලකුණු 02)

**1.17** පාරිභෝගිකයෙකුගේ ආදායම ඉහළ යාම සමග, භාණ්ඩය සඳහා පවතින ඉල්ලුම පහත වැටුනහොත්, එම භාණ්ඩය හඳුන්වනු ලබන්නේ ....................... (සාමාන්‍ය / ගිෆන්) භාණ්ඩයක් ලෙසය. (ලකුණු 02)

**1.18** ....................... (අනුක්‍රමික / ප්‍රතික්‍රමික) බදු ක්‍රමය යටතේ, වැඩි ආදායම් උපයන්නන්ගෙන් වැඩි අනුපාතිකයක් යටතේ ද, අඩු ආදායම් උපයන්නන්ගෙන් අඩු අනුපාතිකයක් යටතේ ද බදු අයකරනු ලැබේ. (ලකුණු 02)

*ප්‍රශ්න අංක **1.19** සහ **1.20** සඳහා උත්තර සැපයීමට පහත සඳහන් දත්ත භාවිත කරන්න. එක් එක් ප්‍රශ්නය සඳහා කෙටි උත්තර ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලියන්න.*

පූර්ණ තරඟය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකට සම්බන්ධව පහත සඳහන් දත්ත ඔබ වෙත සපයා ඇත:

| **නිෂ්පාදනය (ඒකක)** | **සාමාන්‍ය පිරිවැය (රු.)** | **ආන්තික පිරිවැය (රු.)** |
|---|---|---|
| 1 | 85 | 27.5 |
| 2 | 55 | 22.5 |
| 3 | 43.3 | 25 |
| 4 | 40 | 35 |
| 5 | 40 | 45 |
| 6 | 41.6 | 55 |
| 7 | 44.3 | 65 |

ඒකකයක වෙළෙඳපොල මිල රු.45/- ක් යැයි උපකල්පනය කරන්න.

**1.19** ලාභය උපරිම වන මට්ටමේදී ප්‍රමාණය කුමක් ද? (ලකුණු 02)

**1.20** ආයතනයේ අධිප්‍රමාණික ලාභය කොපමණ ද? (ලකුණු 02)

*A කොටසෙහි අවසානය*

# <u>B කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 32)

## 02 වන ප්‍රශ්නය

(a) "මිනිස් අවශ්‍යතාවයන්" සහ "මිනිස් උවමනාවන්" අතර වෙනස උදාහරණ සහිතව **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) නිගකම ආර්ථික විද්‍යාවේ පදනම ලෙස සැලකිය හැක්කේ මන්දැයි **විමසන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 08)

## 03 වන ප්‍රශ්නය

(a) පූර්ණ තරගය යටතේ පවතින ආයතනයක දිගුකාලීන සමතුලිතතාව ප්‍රස්තාරයක් ආධාරයෙන්, **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) ඒකාධිකාරයේ මූලික ලක්ෂණ හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 08)

## 04 වන ප්‍රශ්නය

(a) "මුදලේ අගය" යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි කෙටියෙන් **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) රටක සාමාන්‍ය මිල මට්ටමෙහි ඉහළ යාමක ප්‍රතිඵල (effects) හතරක්(04) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 08)

## 05 වන ප්‍රශ්නය

(a) "ගෙවුම් ශේෂය" යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි, කෙටියෙන් **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) ශ්‍රී ලංකාව අනුගමනය කරන ලද ගෙවුම් ශේෂ ප්‍රතිපත්ති පහක්(05) **සාරාංශගත කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 08)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 28)

### 06 වන ප්‍රශ්නය

(a) ප්‍රවාහ සටහනක (flow chart) ආධාරයෙන්, අංශ දෙකක ආර්ථිකයක ආදායමේ වෘත්ත ප්‍රවාහය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) දළ දේශීය නිෂ්පාදිතය (Gross Domestic Product - GDP) "පවත්නා මිලට ගණනය කිරීම" සහ "ස්ථාවර මිලට ගණනය කිරීම" අතර වෙනස **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(c) කිසියම් ආර්ථිකයක වර්ෂයක කාල සීමාවක් සඳහා සාධක පිරිවැය මිල යටතේ ජාතික ගිණුම් වලට අදාලව උපකල්පිත දත්ත පහත සඳහන් වගුවෙන් පෙන්නුම් කරයි:

| | | **රු. මිලියන** |
|---|---|---|
| (1) | කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදිය | 150 |
| (2) | ධීවර කර්මාන්තය | 50 |
| (3) | පතල් හා කැණීම් | 89 |
| (4) | නිෂ්පාදන කර්මාන්ත | 75 |
| (5) | විදුලිය, ගෑස් හා ජලය | 40 |
| (6) | ඉදි කිරීම් | 58 |
| (7) | තොග සහ සිල්ලර වෙළෙඳාම | 70 |
| (8) | හෝටල් සහ ආපනශාලා | 20 |
| (9) | ප්‍රවාහනය සහ සන්නිවේදනය | 60 |
| (10) | බැංකු, රක්ෂණ සහ දේපළ වෙළදාම් ආදිය | 40 |
| (11) | නිවාස අයිතිය | 10 |
| (12) | රාජ්‍ය සේවා | 10 |
| (13) | පෞද්ගලික සේවා | 13 |
| (14) | විදේශ ශුද්ධ සාධක ආදායම | (10) |
| (15) | වක්‍ර බදු | 30 |
| (16) | සහනාධාර | 20 |

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(i) සාධක පිරිවැය මිලට දළ ජාතික නිෂ්පාදිතය. (ලකුණු 04)

(ii) වෙළෙඳපොළ මිලට දළ ජාතික නිෂ්පාදිතය. (ලකුණු 02)

(මුළු ලකුණු 14)

### 07 වන ප්‍රශ්නය

(a) "ආර්ථික වර්ධනය" සහ "ආර්ථික සංවර්ධනය" අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) ආර්ථික වර්ධනය ළඟාකර ගැනීම සඳහා දායක වන සාධක හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(c) ආර්ථික සහ සමාජ සුභ සාධනය වැඩි දියුණු කිරීම සඳහා රජය වෙළෙඳපොළට මැදිහත් වන ප්‍රධාන ආකාරයන් (main ways) **සාරාංශගත කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 14)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>අවබෝධය<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | හඳුනා දක්වන්න | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | සඳහන් කරන්න | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම. |
| | විමසන්න | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | පැහැදිලි කරන්න | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | අර්ථකතනය කරන්න | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | හඳුනාගන්න | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | සටහන් කරන්න | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | සාරාංශගත කරන්න | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>භාවිතය<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | ප්‍රදර්ශනය කරන්න | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | පිළියෙල කරන්න | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | ප්‍රමුඛතා දක්වන්න | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | සසඳන්න | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>විශ්ලේෂණය<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | සමානකම් බලන්න | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |